# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/31 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයේ 154 (ඇ) 13 වන වගන්තිය යටතේ නැගෙනහිර පළාත් ආණ්ඩුකාර එම්. සෙන්තිල් තොණ්ඩමාන් මහතා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 .09.11 වන දින සිට පහත උපලේඛන 1 හි දැක්වෙන පරිදි ත්‍රිකුණාමල නගර සභා බල ප්‍රදේශයට අයත් ඇතුල් වරාය මාර්ගයේ දිග මීටර් 1128 කින් යුත් ඇවිදින මංතීරුව 2 වන උපලේඛනයේ දැක්වෙන පරිදි වෙනස් කරන බව මෙයින් දන්වා සිටිමි.

| *1 වන උපලේඛනය* | *2 වන උපලේඛනය* |
|---|---|
| අදාළ ඇවිදින මංතීරුව නිර්නාමිකව භාවිතා කරන ලදී. | මෙම මංතිරුව මෙතැන් සිට "ඕෂන් බ්‍රීස් වෝක්වේ" ලෙස හැඳින්වේ. |
| මෙම මංතීරුව වරාය පොලිස් ස්ථානයේ සිට මීටර් 60 කින් (ස්ථාන ලක්ෂ්‍යය 8.5679427, 81.2311127) ආරම්භ වන අතර සිංහල මහා විද්‍යාලයේ සිට මීටර් 51 ක දුරකින් අවසන් වේ. (ස්ථාන ලක්ෂ්‍යය 8.5757138, 81.2252488) | මෙම මංතීරුව වරාය පොලිස් ස්ථානයේ සිට මීටර් 60 ක් දුරින් (ස්ථාන ලක්ෂ්‍යය 8.5679427, 81.2311127) ස්ථාපිත ස්තූපය, නාම සෙල්ලිපිය සහ ඓතිහාසික සෙල්ලිපියේ ආරම්භ වී සිංහල මහා විද්‍යාලයේ සිට මීටර් 51 ක් දුරකින් (ස්ථාන ලක්ෂ්‍යය 8.5757138, 81.2252488) ඉදිකර ඇති ස්තූපය සහ නාම සෙල්ලිපියෙන් නිම වේ. |
| එම මංතීරුවේ මීටර් 1128 ක කොටස දැනටමත් අඩි 3 සිට 4 දක්වා පළලකින් යුතු වේ. | අදාළ මංතීරුවේ ප්‍රදේශ සිංහල මහා විද්‍යාලය ඉදිරිපිට ඇති මීටර් 110 ක කොටස අඩි 4 ක් පළලින් යුතු අතර ඉතිරි මීටර් 1018 ක කොටස අඩි 6 ක් පළලින් යුතු ලෙසත් වෙනස් කෙරේ. |
| අදාළ මංතීරුවේ කිසිදු ආසන පහසුකම් හෝ මල් පෝච්චි නොතිබුණි. | අදාළ මංතීරුවෙහි මීටර් 40 ක පරාසයෙන් පුද්ගලයන් 3 දෙනෙකු අසුන්ගත හැකි පරිදි ලී සහ මල නොබැඳෙන වානේ ආසන සවිකර ඇති අතර ආසන 2 ක් අතර සමාන දුරකින් මල් පෝච්චි 2 ක් තබා වෙනස් කෙරේ. |
| අදාළ මංතීරුවේ ව්‍යාපාරය කටයුතු දැනටමත් සිදු වෙමින් පැවති අතර එම ව්‍යාපාර කටයුතු පදිකයින්ට බාධාවක් විය. | අදාළ මංතීරු ප්‍රදේශයේ කිසිදු පදික වෙළඳ කටයුතු හෝ රැඳී සිට සිදුකරන ලද ව්‍යාපාරික කටයුතු සිදු කළ නොහැකි ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබයි. |

1A - PG 6873 — 14 (2024/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *1 වන උපලේඛනය (සම්බන්ධිතයි)* | *2 වන උපලේඛනය (සම්බන්ධිතයි)* |
| --- | --- |
| එම මංතීරුවේ කිසිදු වීදි ලාම්පු පහසුකම් නොසලසා තිබුණි | අදාළ මංතීරු ප්‍රදේශයේ මීටර් 12 ක පරාසයෙන් සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන වීදි ලාම්පු සවි කර ආලෝක පහසුකම් සපයනු ලැබේ. |
| අදාළ ප්‍රදේශයේ මායිමට ඇතුළත් කරන ලද බිම් පෙදෙස වන කාක දූපත නිසරු භූමි ප්‍රදේශයක් ලෙස තිබිණ. | අදාළ ප්‍රදේශයේ මායිමට ඇතුළත් කර ඇති බිම් පෙදෙස සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම පිණිස එම ප්‍රදේශයේ සුළු ව්‍යාපාර කටයුතු සිදු කළ හැකිය. |
| අදාළ මංතීරු කොටසේ කිසිදු දිදුලන සංඥා පුවරු හෝ උපදෙස් පුවරු සවි කර නොමැත. | අදාළ මංතීරුවේ දිග දැක්වෙන සංඥා කේත පුවරු අටක් සහ මුවන් පාර හරස් කිරීම දැක්වෙන සංඥා පුවරු තුනක් ඉදිකර ඇත. |
| අදාළ මංතීරුවේ නඩත්තු කටයුතු සහ අධීක්ෂණ වගකීම් නීත්‍යානුකූලව තවමත් කිසිවෙකුට පවරා නැත. | ඉහත සඳහන් මංතීරුව නඩත්තු කිරීම සහ අදාළ ප්‍රදේශයේ අධීක්ෂණ කටයුතු නීත්‍යානුකූලව ත්‍රිකුණාමල නගර සභාව වෙත පවරනු ලැබේ. |

**එම්. සෙන්තිල් තොණ්ඩමාන්,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාර.

EOG 09 - 0113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.